සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## පළමු වාර පරීක්ෂණය 2018

## බුද්ධ ධර්මය

9 ශ්‍රේණිය | කාලය පැය 02 යි

නම/ විභාග අංකයඃ

සැලකිය යුතුයි

- පළමු කොටසේ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. එක් ප්‍රශ්නයක් සඳහා ලකුණු දෙක බැගින් හිමිවේ.
- දෙවන කොටසේ පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

## I - කොටස

- අංක 01 සිට 10 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01 බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පෑමට පෙර අවසන් වරට දානය පිරිනමනු ලැබුවේ,

(1) අනේපිඬු සිටුතුමා (2) බිම්බිසාර රජතුමා
(3) චුන්දකර්මාර පුත්‍රයා (4) සුජාතා සිටුදුව

02 සිරිමත් බඹ සිරසෙහි පා පිසිනා
සැරියුත් මහ මුගලන් පිළිවෙලිනා යන කවිය උපුටාගෙන ඇති ග්‍රන්ථය වන්නේ,

(1) සිරිත් මල්දම (2) ලෝවැඩ සඟරාව (3) සුභාෂිතය (4) කව් සිළුමිණ

03 ''මහණෙනි මට හිත ඇති සෑම කෙනෙක්ම මෙම ධර්මාරාම තෙරුන් ආදර්ශයට ගත යුතුය. මල් සුවඳ ආදියෙන් මා පුදන්නෝ නිසිලෙස මා පුදන්නෝ නොවෙති. ධර්මානුකූලව පිළිවෙත් පුරන්නෝ මා පුදන්නෝ වෙති.'' මෙම ප්‍රකාශය තුළින් අපට උගත හැකි ආදර්ශය වන්නේ,

(1) බුදුරජාණන් වහන්සේට මල් පූජා කිරීම උතුම් බවයි.
(2) බුදුරජාණන් වහන්සේට දන්දීම උතුම් බවයි.
(3) බුදුරජාණන් වහන්සේට සුවඳ දුම් පූජාව උතුම් බවයි.
(4) ආමිස පූජාවට වඩා ප්‍රතිපත්ති පූජාව උතුම් බවයි.

04 බුද්ධත්වයෙන් පස්වන වස බුදුරජාණන් වහන්සේ වැඩි බව සඳහන් වන ලක්දිව උතුරු පළාතේ පිහිටි සිද්ධස්ථානයක් වන්නේ,

(1) මහියංගනය (2) නාගදීපය (3) කැලණිය (4) ශ්‍රී පාද ස්ථානය

05 හුස්ම ගැනීමත්, පිටකිරීමත් පිළිබඳ සිහි නුවණ පිහිටුවීමට මගපෙන්වන භාවනාව වන්නේ,

(1) මෛත්‍රී භාවනාව (2) ආනාපාන සති භාවනාව
(3) බුද්ධානුස්සති භාවනාව (4) අසුභ භාවනාව

06 බුදුරජාණන් වහන්සේ බුද්ධත්වයට පෙර සිටම තිබූ ඉලක්කය වූයේ ''තමන් බුද්ධත්වයට පත්ව සසර දුක් විඳින සත්වයින් එයින් මුදවාගෙන නිර්වාණාවබෝධය ලබාදීමයි.'' එයින් ප්‍රකටවන බුදු සිරිතේ විශිෂ්ට ලක්ෂණය වනුයේ,

(1) නිවැරදි දැක්ම (2) අකම්පිත බව
(3) නිවැරදි තීරණ ගැනීම (4) කාරුණික බව

07 අධි ශීල, අධි චිත්ත. අධි ප්‍රඥාවෙන් යුක්තව ප්‍රතිපත්තියෙහි යෙදෙන බැවින් සංඝරත්නය හඳුන්වන ගුණය වන්නේ,

(1) සුපටිපන්න (2) ඤායපටිපන්න (3) උජුපටිපන්න (4) සාමීචිපටිපන්න

08 සැදැහැතියකු විසින් දැක සංවේගය උපදවාගත යුතු ස්ථානවලට අයත් නොවන්නේ,

(1) බෝසතාණන් වහන්සේ උපන් ස්ථානය

(2) බුදුරජාණන් වහන්සේ දම්සක් පැවතුම් සූත්‍රය දේශනා කළ ස්ථානය

(3) බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පෑ ස්ථානය

(4) බෝසතාණන් වහන්සේ පැවිදි වූ ස්ථානය

09 අතීතයේ මුතුන් මිත්තන් බෞද්ධ සිද්ධස්ථාන වන්දනාවට යන විට පාළුව, කාන්සිය, විඩාව දුරුකර ගැනීම හා ශ්‍රද්ධාව ඇතිකර ගැනිම සඳහා ගායනා කර ඇත්තේ,

(1) තුන්සරණ කවි (2) ජන කවි (3) සිව්පද (4) බයිලා ගීත

10 අනුරාධපුර අටමස්ථානයට අයත් නොවන චෛත්‍යයක් වන්නේ,

(1) ථූපාරාමය (2) අභයගිරිය (3) සෝමාවතිය (4) මිරිසවැටිය

- **අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර වරහන් තුළ දි ඇති පිළිතුරු වලින් තෝරා හිස්තැන් පුරවන්න.**

(විශාලා මහනුවර / ශ්‍රීපාද ස්ථානය / නාලක / කිඹුල්වත් නුවර / සැවැත් නුවර / චාපාල චේතිය)

11 සැරියුත් මහරහතන් වහන්සේ පිරිනිවන් පා වදාළේ .................................................................... ගමේදී ය.

12 බුදුරජාණන් වහන්සේ වැඩිම වස්කාලයක් ගතකළ ජේතවනාරාමය පිහිටා ඇත්තේ ...................................................... ය.

13 දහස් සංඛ්‍යාත බැතිමත්හු මහත් ශ්‍රද්ධාවෙන් වැඳ පුදා ගන්නා ස්ථානයක් ලෙස .......................................... සැලකිය හැකිය.

14 මහා ප්‍රජාපතී ගෝතමී දේවිය ඇතුළු පිරිස පැවිදි වූයේ ................................................ කූටාගාර ශාලාවේදී ය.

15 බුදුරජාණන් වහන්සේ ආයු සංස්කාරය අත්හැරියේ ........................................................ නම් ස්ථානයේදී ය.

- **ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා දි ඇති ප්‍රකාශ හරි නම් (✓) ලකුණ ද, වැරදි නම් (✗) ලකුණ ද ඉදිරියෙන් දී ඇති වරහන තුළ යොදන්න.**

16 අටලෝ දහමින් කම්පා නොවීමේ ගුණය තාදී ගුණය නමින් හැඳින්වේ. ( )

17 මහා මංගල සූත්‍රය දේශනා කළේ අනාථපිණ්ඩික සිටුතුමාට ය. ( )

18 ඉතා දුර බැහැර සිට ශ්‍රද්ධාවෙන් රැගෙන එන සිවුපසය පිළිගැන්වීමට සුදුසු බැවින් භික්ෂූන් වහන්සේ පාහුනෙය්‍ය නමින් හැඳින්වේ. ( )

19 මුතියංගණය රජමහා විහාරස්ථානය පිහිටා ඇත්තේ ඌව පළාතේ ය. ( )

20 අභිඥාලාභි භික්ෂුණින් වහන්සේලා අතර අග තනතුර ලද්දේ ප්‍රජාපති ගෝතමී තෙරණියයි. ( )

(ලකුණු 2 x 20 = 40)

## II කොටස

- **පළමුවන ප්‍රශ්න ඇතුළුව ප්‍රශ්න 5 කට පමණක් පිළිතුරු සපයන්න.**

01 කෙටි පිළිතුරු සපයන්න.

(i) සතර අගතිවලින් දෙකක් නම් කරන්න.

(ii) තුන්බෑ ජටිලයන් අතුරින් දෙදෙනෙක් නම් කරන්න.

(iii) බුදු සිරිතෙන් ප්‍රකට වන විශිෂ්ට ලක්ෂණ 2 ක් ලියන්න.

(iv) බුදුරජාණන් වහන්සේගේ රූප සම්පත්තිය කෙරෙහි ප්‍රසාදයටපත් භික්ෂූන් වහන්සේ කවුද?

(v) පළමුව අන් සැමට

නිසිවන බැවින් පිදුමට ඉතිරි පද දෙක ලියන්න.

(vi) භද්දකච්චානා කුමරියගේ මව්පියන් කවුද?

(vii) බුදුරජාණන් වහන්සේගේ අන්තිම බුද්ධ වචනය ලියන්න.

(viii) බුදුරජාණන් වහන්සේ වැඩසිටිය දී පැවිදිව රහත් වූ අන්තිම ශ්‍රාවකයා වුයේ කවුද?

(ix) ශ්‍රීපාදස්ථානය පිහිටි දිස්ත්‍රික්කය නම් කරන්න.

(x) බුද්ධ මාතා නමින් හැඳින්වූයේ කවුරුන් ද? (ලකුණු 2 x 10 = 20)

02 (i) යථාවාදී තථාකාරී හා යථාකාරී තථාවාදී යන්නෙහි අර්ථය පැහැදිලි කරන්න. (ලකුණු 02)

(ii) සමානාත්මතා ගුණය පිළිබිඹු කෙරෙන අවස්ථා දෙකක් බුද්ධ චරිතයෙන් පෙන්වා දෙන්න. (ලකුණු 03)

(iii) ශිෂ්‍ය ජීවිතය සාර්ථක කර ගැනීමට බුදු සිරිතේ එන ආදර්ශ කෙතෙක් දුරට ඉවහල් කරගත හැකිදැයි පැහැදිලි කරන්න. (ලකුණු 05)

03 (i) සංඝරත්නයේ ගුණ දක්වෙන ''සුපටිපන්නෝ'' පාඨය නිවැරදිව ලියන්න. (ලකුණු 02)

(ii) එම පාඨයෙහි සඳහන් සඟ ගුණ 3 ක් නම් කරන්න. (ලකුණු 03)

(iii) සංඝරත්නය වෙනුවෙන් ගිහියන් විසින් ඉටුකළ යුතු යුතුකම් පැහැදිලි කරන්න. (ලකුණු 05)

04 (i) ත්‍රිවිධ චෛත්‍ය නම් කරන්න. (ලකුණු 02)

(ii) සොළොස්මස්ථාන අතුරින් පූජනීය ස්ථාන 3 ක් නම් කරන්න. (ලකුණු 03)

(iii) වන්දනා ගමනකදී අනුගමනය කළයුතු සිරිත් විරිත් මොනවාදැයි පැහැදිලි කරන්න. (ලකුණු 05)

05 (i) බුදු දහමෙහි ඉගැන්වෙන ප්‍රධාන භාවනා ක්‍රම දෙක නම් කරන්න. (ලකුණු 02)

(ii) ආනාපානසති භාවනාව වඩන ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 03)

(iii) භාවනාව වැඩීම තුළින් ශිෂ්‍ය ජීවිතය සාර්ථක කර ගත හැකි ආකාරය දක්වන්න. (ලකුණු 05)

06 (i) සුකරානි අසාධූනි..... ගාථාව සම්පූර්ණ කරන්න. (ලකුණු 02)

(ii) එහි තේරුම ලියන්න. (ලකුණු 03)

(iii) පාපයෙන් වැළකී කුසලයෙහි යෙදීමේ වැදගත්කම විස්තර කරන්න. (ලකුණු 05)

07 පහත දී ඇති මාතෘකා දෙකක් තෝරාගෙන කෙටි සටහන් ලියන්න.

(i) මහා ප්‍රජාපතී ගෝතමී තෙරණිය

(ii) සම්බුද්ධ පරිනිර්වාණය

(iii) රුවන්වැලි මහා සෑය

(iv) ශ්‍රී මහා බෝධිය (5 x 2 = 10)

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| (01) | 3 | (02) | 2 | (03) | 4 | (04) | 2 | (05) | 2 | (06) | 1 | (07) | 3 | (08) | 4 |
| (09) | 1 | (10) | 3 | (11) | නාලක | | | (12) | සැවැත් නුවර | | | (13) | ශ්‍රීපාද ස්ථානය | | |
| (14) | විශාලා මහනුවර | | | (15) | චාපාල චෛතිය | | | (16) | ✓ | (17) | ✗ | (18) | ✗ | | |
| (19) | ✓ | (20) | ✗ | | | | | | | | | | | | |

(2 x 20 = 40)

## II කොටස

01 (i) ඡන්ද, ද්වේෂ. භය, මෝහ

(ii) උරුවේල කාශ්‍යප, නදී කාශ්‍යප, ගයා කාශ්‍යප

(iii) මහා කරුණාව, නිවැරදි දැක්ම, යථාවාදී තථාකාරී ගුණය ආදී ගුණාංග (2 පාඩම)

(iv) වක්කලී හිමියන්

(v) මහ සඟරුවන සෙට

පාහුනෙය්‍යයි අනුව දහමට

(vi) සුප්‍රබුද්ධ රජතුමා - අමිතා බිසව

(vii) හන්දදානි භික්ඛවෙ - ආමන්තයාමි වෝ

වයධම්මා සංඛාරා - අප්පමාදේන සම්පාදේථ

මහණෙනි, කරුණාවෙන් ඔබ අමතමි. සියලු සංස්කාර ධර්ම නැසෙන සුළුය. එබැවින් නොපමාව දුකින් මිදීම පිණිස කුසල ධර්ම සම්පූර්ණ කරන්න.

(viii) සුභද්‍ර පිරිවැජියා

(ix) රත්නපුර

(x) මහා ප්‍රජාපතී ගෝතමී

02 (i) කියන දේ කරන, කරන දේ කියන ගුණය

(ii) 02 වන පාඩම 9 පිටුව බලන්න

(iii) සමස්තයක් සේ සලකා ලකුණු දෙන්න.

03 (i) පාලි පාඨය නිවැරදිව ලියා ඇත්නම් ලකුණු 02 ක් දෙන්න.

(ii) 03 පාඩම

(iii) සමස්තයක් සේ සලකා ලකුණු දෙන්න.

04 (i) ශාරීරික චෛත්‍ය, පාරිභෝගික චෛත්‍යය, උද්දේශික චෛත්‍යය

(ii) 04 පාඩම

(iii) 04 පාඩම 25 පිටුව බලන්න.

05 (i) සමථ භාවනාව, විදර්ශනා භාවනාව

(ii) 05 පාඩම

(iii) අදාළ පිළිතුරට සම්පූර්ණ ලකුණු පිරිනමන්න.

06 (i) සුකරානි අසාධුනි - අත්තනෝ අහිතානිච

යං වේ හිතංච සාධුංච - යං වේ පරම දුක්කරං

(ii) අයහපත් දෑ මෙන් ම තමාට අහිත පිණිස හේතුවන දෑ ද පහසුවෙන් කළ හැකිය. යහපත් දෑ මෙන්ම තමාට හිතකර වූ දේ කිරීම ඉතාම දුෂ්කරය.

(iii) 07 පාඩම

07 එක් එක් මාතෘකාවට ප්‍රමාණවත් ලෙස කරුණු ඉදිරිපත් කර ඇත්නම් සම්පූර්ණ ලකුණු ලබාදෙන්න.